Australian Government

Department of Home Affairs

# Information to be provided to a detainee about identification tests

# හදුනාගැනීමේ පරීක්ෂණ සම්බන්ධයෙන් රැඳවුම්කරුවෙකු හට ලබාදිය යුතු තොරතුරු

Form

1247i SIN

SINHALESE

*Migration Act 1958* (සංක්රමණ පනතේ) ප්රතිපාදන අනුව සංක්රමණ රැඳවුමක සිටින පුරවැසියෙකු නොවන පුද්ගලයෙකු විසින් පහත සඳහන් පුද්ගලික හදුනාගැනීම්වලින් (personal identifiers) එකක් හෝ වැඩි ගණනක් ලබාදිය යුතු බවට බලයලත් නිලධාරියෙකු විසින් ඉල්ලා සිටිය හැකිය:

- අදාල පුද්ගලයාගේ ඇඟිළි සළකුණු හෝ අත් සළකුණු (පත්රිකා සහ තීන්ත හෝ ඩිජිටල් සජීවී ස්කෑන් තාක්ෂණ භාවිතා කර ලබාගත් ඒවා ඇතුළුව)
- අදාල පුද්ගලයාගේ උස සහ බර
- අදාල පුද්ගලයාගේ මුහුණ සහ උරහිස්වල ඡායාරූපයක් හෝ වෙනත් අනුරූපයක්
- අදාල පුද්ගලයාගේ අත්සන
- 1994 සංක්රමණ රෙගුලාසි මගින් නියම කරන ලද ආකාරයේ වෙනත් ඕනෑම පුද්ගලික හඳුනාගැනීම්

**සටහන:** පුරවැසියෙකු නොවන අය විසින් ලබාදිය යුතු පුද්ගලික හඳුනාගැනීම/මි මොනවාද යන්න තීරණය කිරීම බලයලත් නිලධාරීන් විසින් තීරණය කල යුතුය.

ඔබගේ අනන්යතාවය ඇගයීමට ස්වදේශ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව (දෙපාර්තමේන්තුව) හට ඔබගේ පුද්ගලික හඳුනාගැනීම් අවශ්යවේ.

## දෙපාර්තමේන්තුව ඔබගේ පුද්ගලික හදුනාගැනීම(මි) ලබා ගන්නේ කෙසේද?

සංක්රමණ පනත යටතේ, හදුනාගැනීමේ පරීක්ෂණයක් කෲර, අමානුෂික හෝ පහත් කරන ආකාරයට, හෝ මිනිසෙකුව මානුෂිකව සහ ගෞරවය නැතිවන ආකාරයට සිදු නොකල යුතුය.

**හදුනාගැනීමේ පරීක්ෂණය පහත ආකාරයට පවත්වනු ඇත:**

- සංක්රමණ පනත යටතේ හදුනාගැනීමේ පරීක්ෂණ කිරීමට බලය ලත් නිලධාරියෙකු විසින්; [1]
- ඉල්ලා සිටි අවස්ථාවක ඔබගේ ලිංගයටම අයත් බලය ලත් නිලධාරියෙකු විසින්;
- ඔබට අවශ්ය අවස්ථාවක අදාල අවස්ථාවේ ස්වාධීන පුද්ගලයෙකු සිටින අතර සාධාරණ කාලයක් ඇතුලත එම පුද්ගලයා පරීක්ෂණයට සහභාගිවීමට කැමති අවස්ථාවක ස්වාධීන පුද්ගලයෙකු ඉදිරියේ (ඔබ බාලවයස්කාරයෙකු වන අවස්ථාවක ඔබගේ මව හෝ පියා, භාරකරු හෝ ස්වාධීන පුද්ගලයෙකු සිටිය යුතුය); [2]
- ඔබගේ පෞද්ගලිකත්වය සාධාරණ ලෙස ආරක්ෂාකර දෙන ආකාරයට;
- සාධාරණ ආකාරයට බලය උපයෝගී කරගතහොත්, ස්වාධීන පුද්ගලයෙකු ඉදිරිපිට.

බලයලත් නිලධාරියා හැර වෙනත් අයෙකු සිටීමට අවශ්ය අවස්ථාවල, ඔබ විසින් ඉල්ලා සිටි අවස්ථාවක සහ එම ඉල්ලීමට අනුව කටයුතු කිරීම ප්රායෝගික වන අවස්ථාවක, ඔබට විරුද්ධ ලිංගයක පුද්ගලයෙකු ඉදිරියේදී හෝ එවැනි අයෙකුට පෙනෙන ආකාරයට හදුනාගැනීමේ පරීක්ෂණය සිදු **නොකරනු** ඇත.

**මෙයට අමතරව:**

- සමහර අවස්ථානුගත තත්වයන් යටතේ හදුනාගැනීමේ පරීක්ෂණය බලයලත් නිලධාරියෙකු විසින් වීඩියෝ පටිගත කල හැකිය;
- හදුනාගැනීමේ පරීක්ෂණය පවත්වන බලයලත් නිලධාරියා විසින් පරීක්ෂණය පැවැත්වීම සඳහා වෙනත් බලය ලත් නිලධාරියෙකුගේ සහාය ඉල්ලා සිටිය හැකිය.

## නැවත පරීක්ෂණය කිරීම

කලින් ලබාදුන් පුද්ගලික හදුනාගැනීම් සුදුසු නොවන අවස්ථාවක හෝ ලබාගත් පුද්ගලික හදුනාගැනීම්වල නිවැරදිභාවය පිලිබඳව බලයලත් නිලධාරියා සෑහීමකට පත් නොවන අවස්ථාවක, සමාන ආකාරයේ පුද්ගලික හදුනාගැනීම් එක සැසියකදී එක්වරකට වඩා වැඩි වාර ගණනකදී ලබාදීම අවශ්ය විය හැකිය.

ඔබ විසින් වෙනත් අවස්ථාවකදී එකම අකාරයේ පුද්ගලික හදුනාගැනීම් නැවත ලබාදීමට අවශ්ය විය හැකිය. මෙයට හේතුව වන්නේ පරීක්ෂණයක් කරන අවස්ථාවේ හෝ පරීක්ෂණය අවසානවූ සැණෙකින් පුද්ගලික හදුනා ගැනීම් භාවිතා කල නොහැකිබව සැමවිටම පැහැදිලි නොවන නිසාය. නැවත පරීක්ෂණයක් කිරීම සඳහා ජ්යෙෂ්ඨ බලයලත් නිලධාරියෙකුගේ අනුමැතිය බලයලත් නිලධාරියා විසින් ලබා ගැනීම අවශ්ය විය හැකිය.

## භාෂා පරිවර්තකයෙකු සඳහා ප්රවේශය

අවශ්යනම්, හදුනාගැනීම සම්බන්ධ පරීක්ෂණවලට අදාල තොරතුරු අවබෝධ කර ගැනීමට උපකාර කිරීම සඳහා භාෂා පරිවර්තනයෙකුගේ සේවාව ලබාදේ. භාෂා පරිවර්තන සේවාව දුරකථනයෙන් ලබාදිය හැකිය.

## දෙපාර්තමේන්තුව මගින් පුද්ගලික හදුනාගැනීම සම්බන්ධ තොරතුරු රැස් කරන්නේ ඇයි?

සංක්රමණ පනත සහ 1994 සංක්රමණ රෙගුලාසි යටතේ පහත කරුණු ඇතුළුව, ඒවාට සීමා නොවී, හේතු ගණනාවක් වෙනුවෙන් පුද්ගලික හදුනා ගැනීම් රැස්කල හැකිය:

- හදුනාගැනීම සහ අනන්යතාවය සනාථ කිරීම;
- වීසා අයදුම්පත්ර සහ ආරක්ෂණ අයදුම් සම්බන්ධ තීරණ ගැනීමේ දෙපාර්තමේන්තු ක්රියාවලිය වැඩිදියුණු කිරීම;
- අපරාධ ඉතිහාසයක් ඇති හෝ ජාතික ආරක්ෂාව හෝ චරිතය සම්බන්ධ සැකයක් ඇති ඕස්ට්රේලියානු නොවන පුරවැසියන්ව හදුනා ගැනීම සම්බන්ධව දෙපාර්තමේන්තුව සතුව ඇති හැකියාව වැඩි කිරීම;
- සංක්රමණ කටයුතුවලදී අනන්යතා සහ ලියකියවිලිවලට අදාල වංචාවලට විරුද්ධව කටයුතු කිරීම;
- ආරක්ෂණ වීසා බලපත්ර සඳහා අයදුම් කරන හෝ අක්වෙරළ මගින් ඇතුළුවන පුද්ගලයන් (offshore entry persons) විසින් කරන ආරක්ෂණ ඉල්ලීම් ඉදිරිපත් කරන අය ඕස්ට්රේලියාවට පැමිණීමට පෙර ආරක්ෂාව ඉල්ලා සිටීමට ප්රමාණවත් අවස්ථා තිබුණිද යන්න නිර්ණය කිරීම;
- රටින් පිටුවහල් කරන හෝ ඉවත් කරන අයගේ අනන්යතාවය සිය රටවල රාජ්යයන් හට තහවුරු කිරීම.

## ඔබගේ පුද්ගලිකතාව

දෙපාර්තමේන්තුව ඔබගේ පුද්ගලිකත්වයට ගරු කරයි. ඔබ සම්බන්ධ තොරතුරු උපකාරී කර ගන්නා ආකාරය සහ ඒවා කළමණාකරණය කරන ආකාරය අනුව ඒවා ඔබගේ ජීවිතයට බලපෑ හැකි බව දෙපාර්තමේන්තුව දනී. දෙපාර්තමේන්තුව සතුව ඔබ සම්බන්ධයෙන් ඇති තොරතුරු නිවැරදිවීමත්, යාවත්කාලීන වීමත් (up-to-date), අදාලවීමත් වැදගත්වේ.

පුද්ගලික හදුනාගැනීම සම්බන්ධ තොරතුරු රැස් කිරීම, ඒවා ප්රවේශ කිරීම සහ එළිදරව් කිරීම සම්බන්ධ ආරක්ෂාවන් දෙපාර්තමේන්තුව සතුව පවතී. ඔබගේ පුද්ගලික තොරතුරු ආරක්ෂාකාරීව සහ රහසිගතව තබාගන්නා බවට වගබලා ගැනීම සඳහා දෙපාර්තමේන්තු ක්රියාපටිපාටින් අධීක්ෂණය කරයි.

## පුද්ගලිකතාව පිළිබඳ වැදගත් තොරතුරු

*1988* පුද්ගලිකතා පනතෙහි දෙපාර්තමේන්තුව මගින් පුද්ගලික තොරතුරු රැස් කරන සහ පරිහරණය කිරීම සම්බන්ධ ඕස්ට්රේලියානු පුද්ගලිකතා මූලධර්ම 13 ක් අඩංගුවේ. දෙපාර්තමේන්තුව මගින් සිය ප්රධාන කාර්යයන් සඳහා පුද්ගලික තොරතුරු රැස් කරන, භාවිතා කරන සහ හෙළිදරව් කරන ආකාරය සම්බන්ධව තොරතුරු 1441i පුද්ගලිකතා දැන්වීම මගින් ලබාගත හැක. දෙපාර්මේන්තුවේ සාමාන්ය තොරතුරු පරිහරණය කිරීමේ පරිචයන් සම්බන්ධයෙන් (1441i ආකෘතිය ඇතුළුව) පුද්ගලිකතා ප්රතිපත්තිය සම්බන්ධ තොරතුරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වන **https://www.homeaffairs.gov.au/access-and-accountability/our-commitments/privacy** වෙතින් ලබා ගත හැක.

© COMMONWEALTH OF AUSTRALIA, 2021

## දෙපාර්තමේන්තුව මගින් ඔබගේ පුද්ගලික හඳුනාගැනීමේ තොරතුරු කාහට ලබාදිය හැකිද?

මෙම දෙපාර්තමේන්තුව සමඟ ඔබගේ අනන්‍යතාවය පරීක්ෂාකර ගැනීමට අවශ්‍ය නීති බලාත්මක කරන ආයතන, සෞඛ්‍යය ආයතන සහ වෙනත් ආයතන ඇතුළු ආයතන ගණනාවකට ඔබගේ පුද්ගලික හඳුනාගැනීම් සහ ඔබගේ නම සහ ජීව විද්‍යාත්මක තොරතුරු ලබාදීමට දෙපාර්තමේන්තුව හට බලය ඇත. දෙපාර්තමේන්තුව මගින් ඔබගේ පුද්ගලික හඳුනාගැනීම් ලබාගත් විට ඒවා දෙපාර්තමේන්තුව සතුව ඇති ඔබගේ නිල වාර්තාව බවට පත්වේ.

දෙපාර්තමේන්තුව මගින් ජාත්‍යන්තර ගිවිසුම්වලට අනුකූලව රටවල් ගණනාවක් සමඟ ජාත්‍යන්තර වශයෙන් තොරතුරු හුවමාරුකර ගැනීමෙහි කටයුතුවල නිරතවේ. මෙම තොරතුරු හුවමාරු කර ගැනීම් අතර මුහුණේ ඡායාරූප සහ ඇඟිලි සළකුණු දත්ත ඇතුළු පුද්ගලික හඳුනාගැනීම් හුවමාරු කර ගැනීම් ඇතුලත් විය හැකිය. වැඩිදුර විස්තර සඳහා දෙපාර්තෙමින්තු වෙබ් **https://immi.homeaffairs.gov.au/help-support/meeting-our-requirements/biometrics** අඩවිය වන වෙත පිවේසන්න.

රටවල් අතර මෙම තොරතුරු හුවමාරු කර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔබගේ පුද්ගලික හඳුනාගැනීම් හා ගැලපීමක් සිදුවුවහොත්, දෙපාර්තමේන්තුව මගින් ඔබගේ ජීව විද්‍යාත්මක දත්ත, ගමන් බලපත්‍ර හෝ වෙනත් හඳුනා ගැනීමේ ලියකියවිලි හෝ එවැනි ලියකියවිලිවල ඇති තොරතුරු, ඔබගේ සංක්‍රමණ තත්වය සහ සංක්‍රමණ ඉතිහාසය (සංක්‍රමණ ක්‍රියාවලිය අනිසි ලෙස භාවිතා කිරීම හෝ ඒවාට අදාල අපරාධ වැරදි) සහ සංක්‍රමණ කටයුතු සඳහා අදාල වන අපරාධ ඉතිහාසය දෙපාර්තමේන්තුව මගින් හෙළිදරව් කරනු ඇත. මෙම හෙළිදරව් කිරීමේ අරමුණ වන්නේ ඔබගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සහ ඔබ විසින් දෙපාර්තමේන්තුව සහ වෙනත් ආයතන හට එකම අනන්‍යතාවය ලබාදුනිද සහ සමාන ආකාරයේ ඉල්ලීම් ඉදිරිපත් කලාද යන්න නිර්ණය කිරීම සඳහාවේ.

ඔබගේ පුද්ගලික හඳුනාගැනීම් හෙළිදරව් කල හැකි අවස්ථානුගත කරුණු සම්බන්ධ වැඩිදුර විස්තරාත්මක තොරතුරු සඳහා ආකෘති අංක 1243i *Your personal identifying information (ඔබගේ පුද්ගලික හඳුනා ගැනීම සම්බන්ධ තොරතුරු)* කියවිය යුතුය. මෙය දෙපාර්තමේන්තු වෙබ් අඩවිය **https://immi.homeaffairs.gov.au/help-support/departmental-forms** වන වෙතින් ලබාගත හැකිය.

## සාධාරණ ලෙස බලය උපයෝගී කර ගැනීම

බලයලත් නිලධාරියෙකු විසින් හඳුනාගැනීමේ පරීක්ෂණයක් සිදු කිරීම සඳහා හෝ පුද්ගලික හඳුනාගැනීමකින් ලබාගත් පුද්ගලික හඳුනාගැනීමක් හෝ ඕනෑම අර්ථවත් හඳුනාගැනීමක් නැතිවීම හෝ විනාශවීම හෝ වෙන දෙයක් සමඟ මිශ්‍රවීම වැළැක්වීම සඳහා සාධාරණ ලෙස බලය උපයෝගී කරගත හැකිය.

කෙසේවුවද, ඔබ වයස අවුරුදු 18ට වඩා අඩුනම්, ඔබ නොහැකියාවකින් පෙළෙන අයෙකුනම් හෝ ඔබගෙන් ඉල්ලා සිටින පුද්ගලික හඳුනාගැනීම ඔබගේ අත්සන නම්, බලය පාවිච්චි නොකරනු ඇත.[3]

පහත අවස්ථාවල හැර බලය පාවිච්චි කරන්නේ නැත:

- ඔබ විසින් හඳුනාගැනීමේ පරීක්ෂණය සිදු කිරීම ප්‍රතික්ෂේප කලවිට;
- බලය පාවිච්චි නොකර හඳුනා ගැනීමේ පරීක්ෂණය කිරීමට සාධාරණ ලෙස ගත් සියළුම පියවර අවසන්වීම; සහ
- හඳුනාගැනීමේ පරීක්ෂණයකදී බලය පාවිච්චි කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරියෙකු විසින් අනුමත කල යුතුය.[4]

## ඔබගේ අයිතිවාසිකම්

ඔබගේ පුද්ගලික තොරතුරු ඕස්ට්‍රේලියානු පුද්ගලිකතා මූලධර්මවල ඇති අපගේ වගකීම් උල්ලංගණය වන ආකාරයට දෙපර්තමේන්තුව මගින් පරිහරණය කර ඇතිනම්, පහත ආකාරයට පුද්ගලිකතා පැමිණිල්ලක් යොමු කල හැකිය:

**https://www.homeaffairs.gov.au/help-and-support/departmental-forms/online-forms/complaints-compliments-and-suggestions** හි මාර්ගස්ථව ඇති ආකෘතියක් සම්පූර්ණ කිරීම මගින්.

පහත ලිපිනයට යැවීම මගින්:

Department of Home Affairs
GPO Box 241
Melbourne VIC 3001
Australia

ඔබගේ පැමිණිල්ල විමර්ශණය කර ප්‍රතිඵලය ඔබට දැනුම් දෙනු ඇත. දෙපාර්තමේන්තුවේ ප්‍රතිචාරය සම්බන්ධයෙන් ඔබ සෑහීමකට පත් නොවේ නම්, ඕස්ට්‍රේලියානු තොරතුරු කොමසාරිස්වරයාගේ කාර්යාලය (OAIC) වෙත පුද්ගලිකතා පැමිණිල්ලක් යොමු කල හැකිය. OAIC සමඟ පුද්ගලිකතා පැමිණිල්ලක් යොමු කල හැකි ආකාරය සහ OAIC මගින් පුද්ගලිකතා පැමිණිලි විමර්ශණය කරන සහ විසඳන ආකාරය සම්බන්ධ තොරතුරු සඳහා, කරුණාකර OAIC වෙබ් අඩවියෙහි **https://www.oaic.gov.au/privacy/privacy-complaints/lodge-a-privacy-complaint-with-us/** වෙත පිවිසෙන්න. නැතිනම්, දුරකථන අංක 1300 363 992 ඔස්සේ (සදුඳා සිට බ්‍රහස්පතින්දා දක්වා පෙ.ව. 10 සිට ප.ව. 4 AEST/AEDT දක්වා) OAIC අමතන්න.

නැතිනම් ඔම්බඩ්ස්මන් වෙබ් අඩවිය වන **www.ombudsman.gov.au/contact** හි ඇති මාර්ගස්ථ ආකෘතියක් භාවිතා කර කොමන්වෙල්ත් ඔම්බඩ්ස්මන් කාර්යාලය වෙත ලියා දැන්විය හැකිය.

නැතිනම් නොමිළේ දුරකථන අංක 1300 362 072 අමතන්න.

| | |
|---|---|
| *නිවෙස් පිටුව* | **www.homeaffairs.gov.au** |
| *සාමාන්‍ය විමසීම් අංකය* | දුරකථන ක්‍රියාකරුවෙකු හට කථා කිරීමට ඕස්ට්‍රේලියාවේ කාර්යාල වේලාවලදී දුරකථන අංක **131 881** අමතන්න (මෙම වේලාවලින් පිටත පටිගතකල තොරතුරු ඇත). ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත සිටීනම්, ඔබට ලඟම ඇති ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාලය අමතන්න. |

---

1 සංක්‍රමණ පනත [s.5(1))] යටතේ, 'බලයලත් නිලධාරියෙකු' යනුවෙන් අදහස්වන්නේ 'එම ප්‍රතිපාදනය සඳහා අමාත්‍යවරයා හෝ ලේකම්වරයා විසින් ලිඛිතව බලයදී ඇති' නිලධාරියෙකු යන්නයි. සංක්‍රමණ පනත [s.5(1)] යටතේ, 'නිලධාරියෙකු' යනුවෙන් අදහස්වන්නේ:

- i අමාත්‍යවරයා විසින් ලිඛිතව නියමකල නිලධාරියෙකු හැර, දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුෂ හෝ
- ii අමාත්‍යවරයා විසින් ලිඛිතව නියමකල පුද්ගලයෙකු හැර වෙනත් පුද්ගලයෙකු, එනම්:
  - (a) *Customs Act 1901* (*1901 රේගු පනත*) හි අරමුණු සඳහාවූ නිලධාරියෙකු; හෝ
  - (b) *Australian Protective Service Act 1987* (*1987 ඕස්ට්‍රේලියානු ආරක්ෂක සේවා පනත)* හි අරමුණු සඳහාවූ ආරක්ෂක සේවා නිලධාරියෙකු; හෝ
  - (c) ඕස්ට්‍රේලියානු ෆෙඩරල් පොලිස් හෝ ප්‍රාන්ත හෝ ටෙරිටරි රජයක පොලිස් බලකායේ සාමාජිකයෙකු; හෝ
  - (d) මෙම පනතේ අරමුණු සඳහා අමාත්‍යවරයා විසින් බලය ලබාදුන් වෙන ඕනෑම පුද්ගලයෙකු; හෝ
  - (e) සංක්‍රමණ පනතේ අරමුණු සඳහා අමාත්‍යවරයා විසින් ලිඛිතව බලය ලබාදුන් වෙනත් ඕනෑම පුද්ගලයෙකු හෝ ඇතුලත් කරන ලද පුද්ගල පංතියක්, මෙයට අදාල අනුමැතිය ලබාදීමෙන් පසුව අදාල පුද්ගල පංතියේ සාමාජිකත්වය ලබාගත් පුද්ගලයෙකුද අයත්වේ.

2 සංක්‍රමණ පනත (s.5(1)) යටතේ, 'ස්වාධීන පුද්ගලයෙකු' යනුවෙන් අදහස්වන්නේ '(නිලධාරියෙකු හෝ බලයලත් නිලධාරියෙකු හැර) පහත සඳහන් පුද්ගලයෙකි:

- (a) පුද්ගලික හඳුනාගැනීමක් ලබාදෙන හෝ ලබාදීමට සූදානම්වන පුරවැසියෙකු නොවන අයෙකුගේ අයිතිවාසිකම් නියෝජනය කරීමට හැකි අයෙකු; සහ
- (b) පුද්ගලික හඳුනාගැනීම ලබාදෙන හෝ ලබාදීමට සූදානම්වන පුරවැසියෙකු නොවන අයෙකු හට හැකිතාක් දුරට ප්‍රායෝගිකව පිළිගත හැකි අයෙකු; සහ
- (c) පුරවැසියෙකු නොවන අය බාලවයස්කාරයෙකු නම්, බාලවයස්කාරයාගේ වඩාත්ම හොඳ සුබසිද්ධිය නියෝජනය කිරීමට හැකි අයෙකු'.

3 සංක්‍රමණ පනත (s.5(1)) යටතේ, 'නොහැකියාවක් ඇති පුද්ගලයෙකු' යනුවෙන් අදහස්වන්නේ 'පුද්ගලික හඳුනාගැනීමක් ලබාදීමේ අවශ්‍යතාවය සම්බන්ධ සාමාන්‍ය ස්වරූපය සහ එහි ඵල විපාක, සහ එහි අරමුණ අවබෝධකරගත නොහැකි පුද්ගලයෙකු'.

4 සංක්‍රමණ පනත (s.261AK(10)) යටතේ, 'ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරියෙකු' යනුවෙන් අදහස්වන්නේ 'ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරියෙකුගේ රාජකාරි ඉටු කිරීමට ලේකම්තුමා විසින් බලය ලබාදුන් පුද්ගලයෙකු හෝ ලේකම්තුමා විසින් බලය ලබාදෙන පුද්ගල පංතියකට ඇතුලත් කරන ලද පුද්ගලයෙකි'.


© COMMONWEALTH OF AUSTRALIA, 2021